# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/SW/14/18/04/19 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ......................................... | දිනය<br>திகதி<br>Date | 2019.05.15 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>නව සමෘද්ධි සහනාධාර හිමිකම්පත්‍ර ප්‍රදානය - 2019</u>**

මාගේ සමාංක හා 2019.05.14 දිනැති ලිපියට අමතර වශයෙනි.

02. ඒ අනුව මෙහි පහත සඳහන් කරුණු පිළිබඳව ද අවධානය යොමුකර අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකර මා වෙත ලිඛිතව වාර්තා කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි

03. 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නව සමෘද්ධි සහනාධාර ලබාදීමට සුදුසු පවුල් තේරීමේ දී ප්‍රධාන නිර්ණායක 06ක් සහ උප නිර්ණායක 29ක් උපයෝගී කරගෙන සමීක්ෂණයක් සිදුකරන ලදී.

04. 2018 වර්ෂයේ පවුල් 150,000 වෙනුවෙන් නව සහනාධාර ලබාදීම සඳහා ප්‍රතිලාභී පවුල් තෝරාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර ඇති අතර, 2018.08.20 දිනැති අංක DSD/HO/SW/14/18/04/18 දරණ ලිපියේ 03 වන ඡේදය මගින් නව සමෘද්ධි සහනාධාර ලබාදීමට සුදුසු පවුල් තෝරාගැනීමේ නිර්ණායක සරල ලෙස දක්වා ඇත. වර්තමානයේ දී අලුතින් පවුල් ලක්ෂ 06 ක ප්‍රමාණය තෝරාගෙන ඇත්තේ එලෙස සිදුකරන ලද තෝරාගැනීමේ ක්‍රමවේදය තුලය.

05. මේ වනවිට සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයට අදාළ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක හා ඉහත 04 ඡේදයේ සඳහන් ලිපියෙන් මා විසින් ඔබ වෙත ලබාදෙන ලද නිර්ණායකයන්හිද බොහෝ සමානකම් දක්නට ඇත. එබැවින් එම ලිපියෙන් ලබා දුන් උපදෙස් පරිදි නව ප්‍රතිලාභීන් තෝරාගත් බවට මා වෙත තහවුරුවක් එවිය යුතුය.

06. මෙම සමීක්ෂණය මගින් ප්‍රතිලාභීන් තෝරාගෙන මේ වන විට මාස 09 ක පමණ කාලයක් ගතවී ඇති බැවින් එකී නාම ලේඛන වලින් විවිධ හේතූන් මත ඉවත්විය යුතු පුද්ගලයන් වේ නම් ( උදා:- මියයාම, ස්ථිර රැකියා ලැබීම, ආදායම් මට්ටම ඉහලයාම, දීර්ඝ කාලීනව විදේශගතවීම් ආදී ) වසම් මට්ටමින් සොයාබලා කඩිනමින් අදාළ ලේඛණයන් සංශෝධනය කර 2019.05.23 දිනට පෙර ලිඛිතව දැනුම්දෙන මෙන් කාරුණිකව දැනුම් දෙන අතර මේ කාර්යය පිළිබඳව ඔබගේ කඩිනම් අවධානය යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්.ටී.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :- 01. ලේකම් (ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය) - කා.දැ.ස.**


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |